( 9 )

# පුරාණ ශ්‍රී ලංකාවේ අභිලේඛන මාධ්‍යයක් වශයෙන් භාවිත වූ පුස්කොළ ලේඛන කලාව

එම්.ආර්.ටී.ධර්මසිරි
සිව්වන වසර
mrtdharmasiri@gmail.com

අභිලේඛන මාධ්‍යයක් වූ පුස්කොළ ලේඛනයන්හි ආරම්භය නැතහොත් ඓතිහාසික පසුබිම පිළිබඳ ව විමසා බැලීමේ දී එහි ආරම්භය නිශ්චිතව ම ප්‍රකාශ කිරීමට නො හැකි ය. මෙම ලේඛන මාධ්‍ය භාවිත වූයේ ශ්‍රී ලංකාවේ පමණක් නොව අප අසල්වැසි ඉන්දියාවේ ද භාවිත කළ නිසාවෙනි (Buhler 1904:19). මානවයා සංන්නිවේදනය කිරීම ආරම්භ වීමෙන් අනතුරුව අදහසක් උපයෝගී කරගෙන එයට සංකේතාක්ෂර භාවිත කර කරන්නට ඇති අතර පසුකාලීන වනවිට මෙය ලිඛිත භාෂාවක් ලෙස දියුණු වී තිබෙනු දක්නට ලැබේ. ලංකාව තුළ භාවිත වූ මෙම පුස්කොළ ලේඛනයේ ආරම්භය නැතහොත් ඓතිහාසික තොරතුරු පිළිබඳ ව මෙමගින් අනාවරණය කිරීමට බලාපොරොත්තු වේ.

අතීතයේ දී ඉන්දියාවේ ලේඛන කටයුතු උදෙසා බර්ජ් පොතු, කපු රෙදි, දැවපුවරු, උණ පතුරු, සත්ව හම්, ඇත්දළ, ගඩොල්, වලං, පුස්කොළ, සෙල්, ලෝහ තහඩු, උපයෝගී කරගනු ලැබූ බව බියුලරිගේ අදහසයි (Buhler 1904:19). මේ අනුව එකල භාරතයේ ලේඛන කටයුතු සඳහා මෙම පුස්කොළ ලේඛනයන් උපයෝගී කරගෙන තිබෙන බව අනාවරණය වේ. එහි දී තවදුරටත් ප්‍රත්‍යක්ෂ වන්නේ මෙම පුස්කොළ ලේඛනගත කිරීම ප්‍රධාන වශයෙන් භාරතය මූලික කරගෙන සිදු වූ බවයි. පසු කාලීනව ධර්මාශෝක රජු බුදු දහම වැළඳ ගැනීමෙන් පසුව රටවල් නවයකට ධර්ම දූතයින් යවන අතර එයින් මිහිඳු මාහිමියන් වහන්සේ විසින් ශ්‍රී ලංකාද්වීපයට රැගෙන ආ ධර්මයෙන් අනතුරුව මෙරට ලේඛන කලාව ආරම්භ වූ බවයි (ම.ව 1963 xii :56). පුරාවිද්‍යාත්මක සාධක අනුව මීට පෙර අවධියේ දී ද පුස්කොළ ලේඛනයන් භාවිත වූ බවට දැරණියගල අනුරාධපුර ඇතුල් නුවර ආශ්‍රිතව සිදුකළ කැණීම් වලින් (AG:69,85/ ASW 88,89) තියුණු තුඩ සහිත සතත්ව අවශේෂ වලින් නිර්මාණය කළ "පන්හිඳ" නැමති උපකරණයක් හමුවූ බව සඳහන් කර ඇත (Deraniyagala 1990: 150-162). එමගින් පැහැදිලි වන්නේ මෙරට තුළ පුස්කොළ ලේඛන භාවිතය ක්‍රි:පූ තුන්වන සියවස ඉක්මවා ගිය බව නො වන්නේ ද? යන්න ගැටළුවකි. දැරණියගල සොයාගනු ලැබූ උපකරණය මුල් ඓතිහාසික (Early history) යුගයට (ක්‍රි:පූ 600-300) අයත්වනු ලබන බව පෙන්වා දෙනු ලබයි. මේ ආකාරයෙන් පුස්කොළ ලේඛනයන් ආරම්භ වූයේ කෙදින ද යන්න නිශ්චිත ව ම ප්‍රකාශ කළ නො හැකි ය.

අනුරාධපුරය ශිෂ්ටාචාර ගත වීමට පෙර අවධි වල දී ද නොයෙකුත් ලේඛන කටයුතු සඳහා භාවිත වූ බව ප්‍රාථමික මූලාශ්‍රවල තොරතුරු අනාවරණය වී තිබේ.

- ක්‍රි:පූ 6 වන සියවසේ දී විජය රජු පඬි රජුට ද සුමිත්ත කුමරුට ද ලිපි යැවූ බව හා පඬිරට රජු විජය රජුට ලිපියක් එවූ බව සඳහන් වීම (ම.ව 1963 viii:43)
- ක්‍රි:පූ 4 වන සියවසේ පණ්ඩුකාභය රජු දවස රජු හා අභය කුමරු අතර ලිපි හුවමාරුව.. (ම.ව 1963 x:49)
- ක්‍රි:පූ 3 වන සියවසේ උත්තිය කුමරු සිය නැනාට රහස් ලිපියක් යැවීම.. (ම.ව 1963 xxii:99-100)

මෙම ලේඛන කටයුතු සඳහා භාවිත කරනු ලැබූයේ කුමන මාධ්‍යයක් ද යන්න පැහැදිලි ව සඳහන් වන්නේ නැත. නමුත් මහාවංසයේ සිලා **ස්ථම්භං, සෝවණ්ණ පට්ටං, වැටකේ පත** යන්න සඳහන් වීමෙන් ශිලා ස්ථම්භ වල හා රන්පත්වල ලියූ බව මහාවංසයේ සඳහන් වේ (ම.ව 1963 xxvii:124). නමුත් යම්කිසි වැදගත් සිද්ධීන් පමණක් රන් පත්වල සටහන් කරන්නට ඇත. අනෙක් අවස්ථාවල දී මෙම පුස්කොළ ලේඛනයන් භාවිතා කරන්නට ඇතැයි යන්න පෙන්වා දිය හැකි ය. මිහිඳු මාහිමියන් දවස මෙරටට ධර්මය ප්‍රචාරය කිරීමට වැඩම කිරීමේදී ද පාලි අට්ඨකතා ගෙන එන ලද්දේ ලිඛිතව ද අලිඛිතව ද යන්න සඳහන් වන්නේ නැත. එහෙත් මෙම පාලි අට්ඨකතාවල යම් ප්‍රමාණයක් හෝ ලිඛිතව ගෙන එන්නට ඇතැයි යන්න විශ්වාස කළ හැකි ය. එවගේ ම දීපවංස කතුවරයා ග්‍රන්ථය ආරම්භයේදී ද මෙසේ සඳහන් කර ඇත. එනම්

**"නානා වර්ණයන්ගෙන් යුත් කුසුමයන් මෙන් ග්‍රන්ත කරන ලද පරම්පරාගත වංසකතාවන්ගෙන් යුත් සීහළ අට්ඨකතා නම් පුරාණ ලේඛනයක් තමාට උපස්ථම්භක වූ බවයි"**(දී.ව 1997 i:1-3)

මෙ මගින් අපට පැහැදිලි වන්නේ දීපවංසයට පවා පැරණි ග්‍රන්ථ රාශියක් ලංකා ඉතිහාසයේ තිබූ බව නො වන්නේ ද? එම ලේඛනයන් ද පුස්කොළ මාධ්‍යයෙන් රචනා කරන්නට ඇතැයි යන්න සිතන්නට පුළුවන. අනුරාධපුර රාජධානිය කේන්ද්‍රකර ගනිමින් ආරම්භ වූ පිරිවෙන් ක්‍රමය යටතේ ද විවිධ ලේඛන කටයුතු උදෙසා යොදාගන්නට ඇත්තේ මෙම පුස්කොළ ලේඛනයන් යැයි සිතිය හැකි ය. එහි දී මහාවිහාරය, අභයගිරිය ආදී වූ මහා විහාරයන් පමණක් නොව ආලාහන පිරිවෙන, දිඹුලාගල වැනි විද්‍යාස්ථාන ලොව ජාත්‍යන්තර මට්ටමේ පවා අවධානය යොමු කරගත් පිරිවෙන් ලෙස පෙන්වා දීමට හැකි ය. මෙ වැනි දෙස් විදෙස් භික්ෂූන් වහන්සේලාට අධ්‍යාපන කටයුතු උදෙසා පුස්කොළ ලේඛනයන් භාවිතා කරන්නට ඇතැයි යන්න සිතිය හැකි ය.

මෙම ලේඛන මාධ්‍ය සඳහා යෙදාගනු ලබන තල හා තල් ගස් ඉතාමත් ගෞරවයෙන් සලකා ඇත. පුස්කොළ ලේඛනයන් සඳහා භාවිත කරනු ලැබූ පත්තිරු ලබා ගත් තල් ගස කැපීම සම්පූර්ණයෙන් තහනම් කර නියෝග පනවා ඇති බව හතරවන මිහිඳු රජුගේ සෙල්ලිපියෙන් හා උදාමහයාගේ පුලියන්කුලම සෙල්ලිපියෙන් අනාවරණය වනු ලබයි (EZ, Vol.1:87). ඒ අනුව පැහැදිලි වන්නේ පුස්කොළ ලේඛනයන් මෙරට ඉතාමත් සුවිශේෂී ලේඛන මාධ්‍යක් වශයෙන් ක්‍රියාත්මක වී ඇතිබව නො වන්නේ ද? පැරණි කෘතිවල තල් කොළ යන්න සඳහා **"තාලපණ්ණ"** හා **"පණ්ණ"** යන වචන දෙකම භාවිත කර ඇත (Buddhaghosupatti

1982:50). මේ අනුව ලංකාවේ භාවිත වූ බොහෝමයක් පුස්කොළ ලේඛනයන් අතීතයේ පටන් භාවිත වූ බවත් එයින් විශාල ප්‍රමාණයක් ග්‍රන්ථ රචනා කිරීම උදෙසා පමණක් නො වන නමුත් මිනිසාගේ උපන් අවස්ථාවේ දී පටන්ගෙන මරණ මඤ්චකය දක්වා ම මානවයා තමාගේ පෞද්ගලික ලේඛන කටුතුවල දීත් මෙම ලේඛන මාධ්‍ය වන පුස්කොළ යෙදාගෙන තිබෙන බවයි.

ලංකාවේ මෙන් ම ඉන්දියාවේ ද ජාත්‍යන්තර මට්ටමේ ප්‍රසිද්ධ වූ පිරිවෙන් හා විශ්වවිද්‍යාල පද්දතියක් ක්‍රියාත්මක වී තිබේ. එහිදී පුස්කොළ ලේඛනයන් භාවිත කරන්නට ඇතැයි යන්න සිතිය හැකි ය. අනෙක් ලේඛන මාධ්‍යන් වලට වඩා බොහෝ සෙයින් පහසු ලේඛන මාධ්‍යක් වශයෙනුත් ක්‍රමවත්ව හසුරවා තැම්පත් කරගැනීමට හැකියාව ලැබෙන නිසාවෙන් මෙම තල කොළ ලේඛන මාධ්‍යක් වශයෙන් භාවිතා වන්නට ඇතැයි සිතිය හැකි ය.

මෙම සියලු ම තොරතුරු අනුව අනාවරණය වන්නේ පුරාණයේ සිට භාවිත කරනු ලැබූ පුස්කොළ ලේඛනයන්හි ආරම්භය අතීත භාරතයේ ක්‍රියාත්මක වන්නට ඇති බවත් ඊට සාපේක්ෂ ව මෙරට තුළ ද මුල් ඓතිහාසික අවධියේ දී මෙම පුස්කොළ ලේඛනයන් රචනා කරන්නට ඇති බවත් ය. ඉපැරණි යුගයන්හි රචනා කළ පුස්කොළ ලේඛනයන් අභාවයට ගොස් ඇත්තේ ද එය ප්‍රධාන වශයෙන් කාබනික මාධ්‍යක් වූ නිසාවෙන් විය හැකි ය. මෙමගින් පුස්කොළ ලේඛනයන්හි ඓතිහාසික පසුබිම පමණක් නොව විකාශනය පිළිබඳවද යම් අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබේ.

මෙවැනි දීර්ඝ ඉතිහාසයක් තුළින් මෙම පුස්කොළ ලේඛනය රජුන් මාහාමාත්‍යයන් භික්ෂූන් වහන්සේලාගෙන් පටන්ගෙන සාමාන්‍ය ජනයා දක්වා ම තල් හා තල පත්‍රය ලේඛන මධ්‍යක් වශයෙන් මෙරට දී පමණක් නොව භාරතයේ දී ද භාවිත කරන්නට ඇතිබව පෙනේ.

විශේෂයෙන් මෙම පත්‍ර මගින් සකස් කරගනු ලබන්නා වූ පුස්කොළ ලේඛනයන් නිර්මාණය කර ගැනීමේ සාම්ප්‍රදායික ක්‍රමෝපායන් මෙන්ම චාරිත්‍ර වාරිත්‍ර බොහෝමයක් හඳුනා ගැනීමට හැකියාව ලැබේ. එම චාරිත්‍ර වාරිත්‍රයන් තරමකට හෝ වර්තමානය තුළ රඳා පවතින්නේ අපගේ අතීත උරුමයන් වෙනුවෙන් පෙනීසිටින පරම්පරාවක් වර්තමානය තුළද ජීවත් වන නිසා නොවන්නේද යන්න මාගේ අදහසයි. මෙම පුස්කොළ සකස් කර ගැනීමේදී නොමේරූ තල ගස්වල ගොබයන් පමණක් භාවිත කිරීමට හුරු පුරුදුව සිටී. එහි විශේෂත්වය වනුයේ තරමට වඩා වැඩුණු ගස්වල ගොබය තරමක් දරදඬු ස්වරූපයක් ගනු ලබන බවත් එම කොළවල ලේඛන කටයුතු කිරීමට නො හැකි වන බවයි. ගොබය සාමාන්‍යයෙන් අඩි 15-20 දිගින් යුක්ත වන අතර අඟල් 2-4 ක විශ්කම්භයකින් යුක්තවූ බව පෙන්වා දිය හැකිය. මෙම එක ගොබයක කොළ 80-100 ත් අතර ප්‍රමාණයකින් යුක්ත වන බව ලගමුව සඳහන් කරයි.

මෙහි දී තල ගොබය කපා ගැනීම නොමේරූ තල ගොබය තෝරාගෙන එයට උණ බට වළලු කිහිපයක් දමා හිරකර ගනු ලබන්නේ තල ගොබය කපා ගැනීමේදී එය විසිරීමට ඇති හැකියාව අවම කර ගැනීම උදෙසායි. මෙම කපා ගැනීම සිදුකරන්නේද දවස් 21ක් පේවීමෙන් අනතුරුව තෙවරක් ගසට නමස්කාර කිරීමෙනි. එහිදී ගොබය දිග හැර ගැනීමෙන් පසුව ඉරටුව කපා ගැනීම සඳහා "පිහිකටුව" හෝ "දුනු පිහිය" භාවිතා කරනු ලබයි. අනතුරු ව ගොබයෙන්

ලබාගත් කොළ එකට රෝල් කර ගනිමින් "කොළ වට්ටුවක්" සකසා ගනී. සාමාන්‍යයෙන් මෙවැනි කොළ වට්ටුවක විශ්කම්භය අඩි 1 ක් තරම් වන අයුරින් සකසා ගනී. එක ගොබයකින් කොළවට්ටු 6-10 අතර ප්‍රමාණයක් සකස් කරගැනීමට හැකියාව ලැබේ. මෙසේ සකස් කිරීමෙන් අනතුරුව විශාල තඹ කල්දේරමක් වැනි හැලියක පිරිසිදු උල්පත් ජලය දමා ඒ මත පැපොල් කොළ හා ඇට, අන්නාසි කොළ, බිලිං කොළ, අතුරා ඒ මත ස්තරයක් තනා සකස් කරගත් කොළ වට්ටු එහි අතුරනු ලබයි. පසුව එම කල්දේරම වැසෙන්නටම කැප්පෙටිය කොළ පුරවා කපුරෙදි කඩකින් ගැටගසා පැය 2-3 ක් පමණ තම්බා ගනු ලබයි. තල කොළයේ පිටි ගතියක් මතු වූ විට තම්බාගැනීම අවසන් කර ලිපෙන් ඉවත් කර පැය 3-4 ක් ගතවන තුරු කොළ ඉවත් නොකරයි. අනතුරුව කොළ දැවටුම ලිහා ගැනීමෙන් පසුව තල කොළ පිරිසිදු ජලයෙන් සෝදාගෙන මද පවනේ දිවා කාලයේ දින තුනකුත් රාත්‍රී කාලයේ දින තුනකුත් වේලා ගැනීමෙන් පසුව ඔප දැමීම සිදු කරයි.

මෙම ඔප දැමීම සඳහා අඩි 6-7 ක් උසින් යුක්ත අඩි 3-4 ක් පළලින් කණු සිටුවාගත් පට්ටලයක් මගින් තල කොළය ඔප දැමීම සිදු කරයි. එහිදී රාත්තල් 2 ක බර ප්‍රමාණයකින් යුක්ත ගල් කැටයක් එල්ලා පට්ටලයේ හරස් ලීයේ පොල්තෙල් ගෑමෙන් මෙම තල කොළයෙහි ගොරෝසු ස්වරූපය පහවන තෙක් පිරිමැදගනු ලබයි. නැවත වතාවක් සෝදා එය මද පවනේ හා හඳ එළියේ වියලා ගැනීමෙන් ලේඛන කටයුතු සඳහා උපයෝගී කර ගැනීමේ හැකියාව පවතිනු ලබයි. පසු කාලයක දී මෙම තල කොළ ලේඛන කටයුතු සඳහා යොදා ගන්නේ නම් මුළුතැන්ගෙයි දුම්මැස්සේ ආරක්ෂිතව තබයි. ඉන්දියානු සම්ප්‍රදාය තුළ කොළ පිරිමැදීම උදෙසා භාවිත කර ඇත්තේ ගල් වලින් හා හක්ගෙඩි වලිනි. නමුත් ඉන්දියාවේ මේ අයුරින් භාවිතා කළද ලාංකේය ඉතිහාසයේ එවැනි සම්ප්‍රදායක් හඳුනා ගැනීමට නො හැකි ය (ලගමුව 2006 :102).

අනතුරු ව කොළ කපා ගැනීම සිදු කරයි. කොළ කපා ගැනීම තමන්ට අවශ්‍ය ආකාරයෙන් සිදුකර ගැනීමට හැකියාවක් නොමැත. ඒ සඳහා වූ යම් කිසි ප්‍රමිතිකරණයක් ක්‍රියාත්මක වනු ඇත. එම ප්‍රමිතිකරණය නම් පුස්කොළ පොතක උපරිම දිග අඟල් 32 ක් වන බවත් අවම දිග ලෙස අඟල් 7 ක් බව දක්වා තිබේ. නමුත් මෙය බෞද්ධ ආගමික ග්‍රන්ථ වලට පමණක් සීමා වනු ඇත. කොළ කපා ගැනීමෙන් පසුව සිදුරු කර ගැනීම සිදු කරගත යුතු විය. එය කැපීමේ ක්‍රමයකට මෙන්ම විදීමේ ක්‍රියාවලියකින් ද සිදුකර ගනී. මෙම ක්‍රියාවලිය සුළි කැපීම යනුවෙන්ද හඳුන්වා දිය හැකි අතර ඒ සඳහා යම් ක්‍රමවේදයක් භාවිතා කර ඇත. එනම් ඕනෑම දිග ප්‍රමාණයේ තල කොළ පත්‍රයක් වුවද පළමුව එය සමානව තුනට නමාගනු ලබයි. පසුව හතරට නමා ගනී අනතුරුව දෙකෙළවරෙහි සිට දෙවෙනි හා තෙවෙනි රේඛා අතර සමාන දුරකින් මෙම සිදුරු විද ගැනීම සිදු කරයි. ඉන් අනතුරුව ලේඛන කටයුතු සඳහා මෙම පුස්කොළය භාවිතා කිරීමට හැකියාව පවතී.

**පුස්කොළ ලේඛනයන්හි විශේෂ ලක්ෂණ.**

අපගේ පුරාණ ලේඛන සම්ප්‍රදාය තුළ ගොඩනැගුණ පුස්කොළ ලේඛනයන්හි සුවිශේෂී ලක්ෂණ රැසක් දක්නට ඇත. ඒ අනුව අනාදිමත් කාලයක් පුරාවටම පැවතුණා වූ ලේඛන ක්‍රමෝපායන් ගේ සුවිශේෂ ලක්ෂණ පහත ආකාරයෙන් පෙන්වා දීමට පුළුවන.

**අක්ෂරවල ස්වභාවය.**

මෙහි පළමු ලක්‍ෂණය වශයෙන් අක්ෂරවල වර්ග කිහිපයක් මෙම පුස්කොළ ලේඛනයන් තුළ අන්තර්ගත කර තිබෙනු දක්නට ලැබේ. එහිදී මෙම අක්ෂර වර්ග මෙසේ වර්ග කිරීමට හැකියාව ලැබෙනුයේ ප්‍රාදේශීය වශයෙන් ලංකාව රුහුණු, පිහිටි, මායා, යනුවෙන් ඇතිවූ බෙදීම පදනම් කරගෙන යැයි පෙන්වා දිය හැකි ය. එහිදී එක් එක් ප්‍රදේශයන් වලට ආවේණික වූ හැඩයන් කිහිපයක් දක්නට ලැබුණි. එපමණක් ද නොව මෙම අක්ෂරයන් එකිනෙකට වෙනස් වනු ලැබූයේ එම ප්‍රදේශයන්හි අක්ෂර ලිවීමේදී ඇති වූ සුළු සුළු වෙනස්කම් පදනම් කර ගනිමිනි. ඒ අනුව එක් එක් ප්‍රදේශයන් වලට ආවේණික හැඩයන් කිහිපයක් දක්නට ලැබූ අතර එම පදනම යටතේ අක්ෂර පහත අයුරින් කොටස් තුනකට වර්ග කර දැක් වේ.

- රුහුණේ භාවිත කරනු ලැබූ අක්ෂර වූයේ "මුළුකුරු" නමන් හැඳින්වූ අක්ෂර විශේෂයකට පැහැදිලි කරුණකි. විශේෂයෙන් මෙම අක්ෂර යම් කෝණාකාර හැඩයක් නැතහොත් කෝණ සහිත හැඩයක් භාවිත කරමින් පුස්කොළ රචනා කරන්නට ඇති බවයි.

- "ගජකුරු" නමින් හඳුන්වනු ලැබූයේ පිහිටි රටේ භාවිතා කරනු ලැබූ අක්ෂර විශේෂයකි. මෙම අක්ෂර ඕවලාකාර හෙවත් අණ්ඩාකාර බවින් යුක්ත වූ නිසාවෙන් මෙසේ වර්ග කරන්නට ඇත. පිහිටි රටේ භාවිත වූ අක්ෂරයන් පත්තිරුවෙහි යම් අලංකාරාත්මක ස්වරූපයක් ඉස්මතු කිරීමට සමත් වේ. මේ ආකාරයෙන් ගජකුරු අක්ෂර පිහිටි රටේ පුස්කොළ රචනා කිරීමේ භාවිතා කර ඇත.

- මායා දේශයේ භාවිතා කරනු ලැබුවා වූ පුස්කොළ ලේඛනයන්හි අක්ෂර රවුම් හෙවත් වටකුරු හැඩයකින් යුක්ත වූ අතර එබැවින් එම අක්ෂර "සිහකුරු" වශයෙන් හඳුන්වනු ලැබී ය. මෙම මායා දේශයේ පුස්කොළ ලේඛන රචනා කිරීම උදෙසා මෙම අක්ෂර විශේෂයෙන් භාවිතා කරන්නට ඇතැයි යන්න පෙන්වා දිය හැකි ය.

මෙම ප්‍රාදේශීය වශයෙන් ඇතිවූ වෙනස්කම් වලට අමතරව අක්ෂරයේ තිබූ නොයෙකුත් ලක්‍ෂණයන් අනුව තවත් ආකාරයකින් අක්ෂර වර්ගකර තිබෙනු දක්නට ලැබේ. මෙම අක්ෂරවල හැඩයන් අනුව එම අක්ෂර සිංහක්ෂර, ගජාක්ෂර, හංසාක්ෂර, වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය. ඒ අනුව සිංහක්ෂර වශයෙන් හඳුන්වනු ලැබූයේ ආයත චතුරස්‍රාකාර හැඩයක් ගනු ලබන අක්ෂර වේ. ගජාක්ෂර යනුවෙන් හඳුන්වනු ලැබූයේ වටකුරු නැතහොත් රවුම් හැඩයක් ගනු ලබූ අක්ෂර පද්ධතියකි. එමෙන්ම හංසාක්ෂර වශයෙන් හඳුන්වනු ලබන්නේ සිහින් වූත් පටු වූත් අක්ෂර වශයෙන් පෙන්වාදිය හැකි ය. මේ ආකාරයෙන් පුස්කොළ ලේඛනයන්හි භාවිත වූ අක්ෂර පද්ධතීන් පිළිබඳව විමර්ශනාත්මකව පෙන්වා දිය හැකි ය. ශ්‍රී ලංකාව ප්‍රාදේශීය

වශයෙන් රුහුණු පිහිටි මායා වශයෙන් කොටස් තුනකට බෙදා තිබූ ආකාරය දැක්වෙන සිතියමක් මෙහි දක්වා තිබීමෙන් පැහැදිලිව මෙම අක්ෂර අනුව මෙරට බෙදා තිබූ ආකාරය පැහදිලි වේ.

**පිටු අංක යෙදීමේ ක්‍රියාවලිය**

පුස්කොළ ලේඛනයන්හි පිටු අංක යෙදීමේදී භාවිතා කරනු ලැබූයේ අරාබි ඉලක්කම් හෝ රෝම ඉලක්කම් නො වේ. එහිදී පුස්කොළ පත්තිරුවන් අංකගත කරනු ලැබූවේ ස්වරාක්ෂරයන් උපයෝගී කරමිනි. ඒ අනුව මිශ්‍ර සිංහල හෝඩියේ ස්වර අක්ෂර 14 ත් එවගේ ම අනුස්වාරය හා විසර්ගයත් යොදාගනිමින් ස්වර 16කින් යුක්ත වූ අතර ව්‍යංජනාක්ෂර ස්වරයන් සමග වර නැගීමෙන් මෙම පුස්කොළ ලේඛනවල අංකගත කිරීම සිදු කරනු ලැබූ බව මැනවින් ප්‍රත්‍යක්ෂ වේ. එහිදී පත්තිරුවෙහි වම් කෙළවරෙහි මෙම අක්ෂරයන් යොදනු ලබයි. මුලින්ම "ක" ස්වරයන් ආරම්භ කිරීම සිදු කරයි. මෙම අංකනය කිරීමේදීද පත්තිරුවේ දෙපසෙහිම අංකගත කිරීම නො කරයි. එක් පැත්තක පමණක් මෙහි අංකය අක්ෂරයකින් සටහන් කරයි. එය සම්ප්‍රදායානුකූල ව පැවත එන්නක් වශයෙන් පෙන්වාදිය හැකි ය. මෙම මිශ්‍ර සිංහල හෝඩියෙන් අක්ෂර 544 ක් සකසා ගැනීමට හැකියාව ලැබේ.

**විරාම ලක්ෂණයන් භාවිතය.**

මෙම පුස්කොළ ලේඛනයන් රචනා කිරීමේදී සිදු කරනු ලබන තවත් සුවිශේෂී ලක්ෂණයක් වශයෙන් විරාම ලක්ෂණ භාවිතා කිරීම පෙන්වා දිය හැකි ය. මෙම පුස්කොළ ලේඛන රචනා කිරීමේදී නොයෙකුත් විරාම ලක්ෂණයන් යොදාගෙන ඇත. මෙම විරාම ලක්ෂණවල යම් අලංකාරයක්ද දක්නට ලැබේ. මෙම විරාම ලක්ෂණයන් පුස්කොළ රචනා කිරීමේදී යොදාගනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳව විමසා බලමු. විරාම ලක්ෂණයන් අතර කාකපාදය, හංසපාදය, කුණ්ඩලිය, ඔරහන හෙවත් වරහන, පෙයියාලම යන විරාම ලක්ෂණයන් වැදගත් වනු ලබයි. එම ලක්ෂණයන්ට භාවිතා කරනු ලබන සංකේත පහත ආකාරයෙන් පෙන්වාදිය හැකි ය.

- කාකපාදය - X
- හංසපාදය - ⋀
- කුණ්ඩලිය - ෴
- ඔරහන - ( )
- පෙයියාලම - ෴පෙ෴

මෙම විරාම ලක්ෂණ වලින් කාකපාදය යොදාගනු ලබන්නේ යම්කිසි වචනයක අක්ෂරයක් මගහැරී ගිය අවස්ථාවක දී එය නිවැරදි ව සටහන් කිරීම උදෙසා ය. එවගේ ම හංසපාදය යොදාගනු ලබන්නේ යම්කිසි ආකාරයකින් මගහැරී ගිය කොටසක් ලිවීම සඳහා මෙම විරාම ලක්ෂණය යෙදාගනු ලබයි. මේ ආකාරයෙන් වෙනම ලියන ලද පේළිය හැදින්වීම සඳහා " දරුපෙළ" යන වචනය භාවිතා කර ඇත. කුණ්ඩලිය හෙවත් සර්පගැටය භාවිතා කිරීම

සිදුවන්නේ ඡේදයක් අවසානයේදී තිත වෙනුවට යන්න පැහැදිලිය. පුස්කොළ ලේඛන රචනා කිරීමේදී යමක් සමාලෝචනාත්මකව දැක්වීම උදෙසා ද්වී කුණ්ඩලිය යොදාගනු ලබයි. (෴෴) කොටසක් වැඩිදුරට පැහැදිලි කිරීමේදී තෙකුණ්ඩලිය භාවිතයට ගනු ඇත. එමෙන් ම පරිච්ඡේදයක් අවසානයේදී ද්වී කුණ්ඩලි දෙකක් භාවිතා කරයි. ඔරහන හෙවත් වරහන භාවිතා කරනු ලබන්නේ වැඩි කොටසක් ඉවත් කර ගැනීම සඳහාත් අමතර කොටසක් එක්කර ගැනීම සඳහාත් මෙම ඔරහන භාවිතා කර ඇත. එමෙන්ම යමක් නිරන්තරයෙන් රචනා කිරීමේදී පෙයියාලම යොදා ගැනේ. එහිදී දෙපසින් කුණ්ඩලියත් මැදින් පෙයියාලමත් භාවිතා කර ඇත. මෙම විරාම ලක්‍ෂණය යොදන ස්ථානයන් අනුව පෙයියාලම වර්ග කිහිපයකට බෙදා දැකවීමට පුළුවන. එනම් ආදි පෙයියාලය වගන්තියක් මුලට යෙදී මධ්‍ය පෙයියාලම මැදට යෙදේ. අන්ත පෙයියාලම අවසානයේ යෙදෙන අතර සර්ව පෙයියාලම සම්පූර්ණ වගන්තියටම භාවිතා වේ. උක්ත අයුරින් දැක්වූ ආකාරයට පුස්කොළ ලේඛනයන්හි භාවිත වූ නොයෙකුත් සංකේතයන් දක්නට පුළුවන.

**අංක භාවිතය.**

මෙම පුස්කොළ ලේඛනයන් රචනා කිරීම සඳහා යොදාගනු ලැබූ විශේෂී ලක්‍ෂණයක් වූයේ අංක භාවිත කිරීමයි. එහිදී මෙම ලේඛන කටයුතු වලදී අංක ක්‍රමය භාවිත කරනු ලැබූයේ වර්ෂ ක්‍රමය දැක්වීම උදෙසා හා තවත් නොයෙක් ගණන් ක්‍රමයන් දැක්වීම සඳහා ය. එම වර්ෂ ක්‍රමයන් සටහන් කිරීමේදී යොදාගනු ලැබූ ක්‍රියාපටිපාටිය වූයේ ශක වර්ෂ ක්‍රමය හෝ බුද්ධ වර්ෂ ක්‍රමයයි. ශක වර්ෂ ක්‍රමය යටතේ වර්ෂය දක්වන්නේ නම් "ශකාබ්දම්" වශයෙනුත් බුද්ධ වර්ෂ ක්‍රමය යටතේ දක්වන්නේ නම් "සුගතාබ්දම්" වශයෙනි. එහිදී ප්‍රධාන වශයෙන් අංකයන්ට ආවේණික වන්නා වූ අක්‍ෂර මෙන්ම ප්‍රත්‍ය කිහිපයක්ද භාවිත කර ඇත. එම වර්ෂ දැක්වීමේ ක්‍රමය හඳුන්වනු ලබන්නේ කටපයාදී සංඛ්‍යා ක්‍රමය වශයෙන් දක්වා තිබේ. එම අංකනයන් මෙසේ පෙන්වා දිය හැකි ය.

- ක ට ප ය ත්‍යාම් -1
- ඛ ඨ ඵ ර දුම් පම් ත්‍රුම් - 2.
- ග ඩ බ ල - 3
- ඝ ඪ භ ව - 4
- ද ම ශ - 5
- ච ත ෂ - 6
- ඡ ථ ෂ - 7
- ජ ද හ - 8
- ඣ ධ ළ - 9
- න ඥ - 0

පසුකාලීන වන විට මෙම කටපයාදී ක්‍රමය සම්පූර්ණයෙන් ම අභාවයට ගොස් තිබෙන අතර ඒ සඳහා පුස්කොළ ලේඛන රචනා කිරීමේදී ලිත් ලකුණු භාවිතා කර තිබේ. එනම් අක්‍ෂර ක්‍රමයෙන් ඉවත් ව ගොස් නොයෙකුත් සංකේතයන් අංක වලට ආදේශ කරමින් භාවිතා කරන්නට ඇතැයි යන්න පැහැදිලි ය. එම ලිත් ලකුණු හෝඩිය කෙසේද යන්න පිළිබඳව මෙසේ ඉදිරිපත් කර ඇත.

**කෙටි යෙදුම්**

ම.ව - මහාවංසය

දී.ව - දීපවංසය

EZ - Epigraphia Zeylanica

AG - Anuradhapura Gediige

ASW - Anuradhapura Salgaha Watta

**ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය**

කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ***දීප වංසය***, 1959. ඇම් ඩී ගුණසේන සහ සමාගම, ඕල්කට් මාවත කොළඹ 11.

කොඩිතුවක්කු. කේ, ***කටපයාදී අක්‍ෂර භාවිතය හා කාල නිර්ණ මාධ්‍යයක් ලෙස එහි වැදගත්කම***, 1991. දේශීය පුරාවිද්‍යා සමුළුවට ඉදිරිපත් කරන ලද පත්‍රිකාව.

කොඩිතුවක්කු. කේ, ***අපේ ඉපැරණි වර්ෂ දැක්වීමේ ක්‍රම***, 2002 දිවයින 2002.01.21

ලගමුව, ආරිය. ***ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව***, 2006. සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමෙන්තුව, බත්තරමුල්ල.

සුමංගල හිමි හා දේවරක්ෂිත පඬිතුමා, ***මහා වංසය***, 1996. අස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

***Buddhaghosuppatti ed***. By James Gray, London 1892

Buhler, JG 1904. ***Indian Palaeographhy***, Bombay.

Deraniyagala US. 1972. The Citadel of Anuradhapura. Deraniyagala US, 1969. Excavation in the Gedige Area, ***Ancent Ceylon No.2***, Colombo.

Deraniyagala US, 1990. Radiocarbon Dating of Early Brahmi Scripts in Sri Lanka, 600-500 B.C. ***Ancent Ceylon No*** Vol. 6 No.12, Colombo.